# 6 ශ්‍රේණිය - නර්තනය

## පාඩම : ප්‍රස්තාරකරණයේ යෙදෙමු

**( නිපු. අං. 2.7 )**

තාලය යනු , නර්තන විෂය තුළ දී ඉතාමත්ම වැදගත් වන කරුණකි. **තිත** යනුවෙන් හැඳින්වෙන්නේ ද එයයි. **තැලීම** යන අර්ථයෙන් තාලය යන වදන ගොඩ නැගී ඇත. **අමරකෝෂය** නම් ග්‍රන්ථයේ සඳහන් වන්නේ ' **තාල කාල ක්‍රියා මානම්** ' ලෙස ය. එහි තේරුම වන්නේ , යම් ක්‍රියාවකට ගතවන කාලය මැන බලන්නේ තාලය මගින්වන බවයි.

තාල තැබීමට යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩය වන්නේ **තාලම්පටයි**. තාලම්පට පංචතූර්ය වර්ගීකරණයේ **ඝන** නම් කොටසට අයත් වේ. **අත් තල වැයීම** ( අත්පොඩි ) මුල් වී තාලම්පට නිර්මාණය වූ බව සඳහන් වේ. අතීතයේ දී **කෛතාලම** යන නමින් ද තාලම්පට හඳුන්වා තිබේ. **කෛ** යනු ද්‍රවිඩ භාෂාවෙන් අතය. එබැවින් ඉහත සඳහන් කරන ලද කරුණෙන් ද පැහැදිලි වන්නේ **අත්තල වැයීම** මුල් වී තාලම්පට නිර්මාණය වී ඇති බවයි. තාලය සම්බන්ධයෙන් වැදගත්වන කරුණු බොහොමයකි .

### මාත්‍රා

මාත්‍රයක් යනු , එක් නිමේෂයකි ; තත්පරයකි ; සැනයකි . මාත්‍රා වර්ග කීපයක් හඳුනාගත හැකිය .

**ලඝු , ගුරු , ප්ලුත**

- ලඝු මාත්‍රයක් යනු , නොඇදෙන අක්ෂරයකි.
    - **නිද :- අ , ර , ග , ට**
- ගුරු මාත්‍රයක් යනු , ඇදී කියවෙන අක්ෂරයකි.
    - **නිද :- ආ , රා , ගා , ටා**
- ප්ලුත මාත්‍රයක් , යනු ගුරු අක්ෂරයක් සමග හල් අකුරක් එක් වීමෙන් හෝ ලඝු අක්ෂරයක් සමඟ හල් අකුරු දෙකක් එක් වී සෑදෙන මාත්‍රා විශේෂයකි.
    - **නිද :- ලාල් , හාල් , පාන් , ලක්ස් , ෆැක්ස්**
- හලන්ත ගුරු මාත්‍රයක් යනු , හල් අක්ෂරයක් සමඟ යෙදෙන ලඝු අක්ෂරය හා එම හල් අක්ෂරය යන දෙකම එක් මාත්‍රයක් ලෙස සලකා සෑදෙන මාත්‍රා විශේෂයකි .
    - **නිද :- උඩින් , බිමින් , පහන්**

සුදු රතු කහ මල්

අර ගෙන පන් සල්

ඉහත පද පෙළ තාලම්පට රැගෙන එක් වචනයකට එක් තැලීමක් පමණක් කරමින් ක්‍රියාවේ යෙදෙමු. එම වචන වල දී තාලම්පට වදින අක්ෂරය රවුම් කර කරගනිමු. එම රවුම් කරන ලද අක්ෂරය එක (1) ලෙස නම් කරමු. ඉතිරි අකුරු වලට අංක දෙක යනාදී ලෙස නම් කරමු.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| / | | / | | / | | / | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| සු | දු | ර | තු | ක | හ | ම | ල් |

## ආඝාතය

ආඝාතය යනු **තාල තැබීමයි. නොහොත් තාලය පිහිටුවීමයි.** යම් ගායනයක හෝ නර්තනයක හෝ වාදනයක දී **තාලම්පොට වදින අවස්ථාව** නොහොත් ස්ථානය ආඝාතය ලෙස හැඳින්විය හැකිය. ( ඉහත ප්‍රස්තාරය නිරීක්ෂණය කරන්න. සෑම ආවර්තයක ම පළමු මාත්‍රය මත තාලම්පට වාදනය කර තිබේ. ' / ' යන සංකේතය ( තෙයි ) යොදා තිබෙන්නේ එම ස්ථානයේ ය. එසේ තාලම්පට වදින ස්ථානය ආඝාතය වේ )

## තාලම්පට වාදනය



පංචතූර්ය වර්ගීකරණයට අනුව තාලම්පට අයත් වන්නේ **ඝන** වාදය භාණ්ඩ කොටසට ය. යම් ගායනයක , වාදනය හෝ නර්තනයක **තාල රූපය පෙන්වීමට** තාලම්පට භාවිතා කරනු ලැබේ. තාලම්පටින් නිපදවිය හැකි ධවනි දෙකක් වේ. ඒ , **තිත්** හා **තෙයි** යන ධවනි දෙකයි. තිත් යන්න වාදනය වන්නේ තාලම්පට හි පියන් දෙක එකට තද වන ලෙස ගැසීමෙනි. එය **ක්ෂණාන්ත** ලෙස ද හඳුන්වනු ලැබේ. එසේ හඳුන්වන්නේ **ඉතා ඉක්මනින් ( ක්ෂණයකින් )** එම ශබ්දය නැති වන හෙයිනි. තෙයි යන්න වාදනය කරනු ලබන්නේ තාලම්පටෙහි පියන් දෙක එකට ඇතිල්ලී ගොස් හඬ විහිදී යන ලෙසය. එය **හීනාන්ත** ලෙස හඳුන්වනු ලැබේ. එසේ හඳුන්වන්නේ , එම ශබ්දය එකවර නැතිවී නොගොස් ක්‍රමයෙන් **අඩු වී ගොස් ( හීන වී ගොස් )** නැති වන නිසාවෙනි. ප්‍රස්තාරකරණ දී , තිත් යන්න **[ ^ ]** ලෙසත් තෙයියන්න **[ / ]** ලෙසත් සළකුණු කරනු ලැබේ.

## දේශීය තිත් ප්‍රභේද ( තාල රූප )

මාත්‍රා ප්‍රධාන කරගෙන තිත් රූප ( තාල රූප ) නිර්මාණය වේ. තිත් රූපයක් නිර්මාණය වීමට **අවම වශයෙන් මාත්‍රා දෙකක්වත් ( 2 ) තිබිය යුතුය.** ඊට වඩා මාත්‍රා එකතු වීමෙන් විවිධ තාල රූප නිර්මාණය වේ.

## තනි තිතේ ප්‍රභේද

තනි තිත යනු සමාන මාත්‍රා කැටිවීම් වලින් සමන්විත වූ තිත් ප්‍රභේදයි ( තාල රූපයි). තනි තිතේ තාල රූප තුනක් දැකගත හැකිය.

- **සුළු තනි තිත** :- මාත්‍රා 2 බැගින් කැටි වීමෙන් නිර්මාණය වේ.
- **මැදුම් තනි තිත** :- මාත්‍රා 3 බැගින් කැටි වීමෙන් නිර්මාණය වේ.
- **මහ තනි තිත** :- මාත්‍රා 4 බැගින් කැට වීමෙන් නිර්මාණය වේ.

- **සුළු තනි තිත , අඩ තිත** වශයෙන් ද
- **මැදුම් තනි තිත , මධ්‍ය තිත** වශයෙන් ද
- **මහ තනි තිත , තාල තිත** වශයෙන් ද , හඳුන්වනු ලැබේ.

- ✓ සුළු තනි තිත -> මාත්‍රා දෙක තාලය , මාත්‍රා 2 තාල රූපය , 2 + 2 තාල රූපය ලෙස ද හඳුන්වයි
- ✓ මැදුම් තනි තිත -> මාත්‍රා තුනේ තාලය , මාත්‍රා 3 තාල රූපය , 3 + 3 තාල රූපය ලෙස ද හඳුන්වයි.
- ✓ මහ තනි තිත -> මාත්‍රා හතරේ තාලය , මාත්‍රා 4 තාල රූපය , 4 + 4 තාල රූපය ලෙස ද හඳුන්වයි.

තනි තිතේ තාල රූප වලට තාල තැබීමේ දී , තාලම්පටින් වාදනය වන්නේ තෙයි [ / ] යන්න පමණි. එකම මාත්‍රා බෙදීමක් සහිත වීම එයට හේතුවයි.

## ප්‍රස්තාරකරණය

යම් ගායනයක් හෝ පද කොටසක් , ඊට අදාල තාල රූපය තුළ විහිදී පවතින  ආකාරය විධිමත්ව නිරූපණය කරනු ලබන්නේ ප්‍රස්තාර භාවිතයෙනි. එබැවින් ප්‍රස්තාරකරණය යනු සංකීර්ණ වූත් ,වැදගත් වූත් ක්‍රියාවලියකි. සංගීත කලාව තුළ භාවිතා වන්නේ ස්වර ප්‍රස්තාරයන් ය. නමුත් නර්තන විෂය තුළ භාවිතා වන්නේ පද ප්‍රස්තාරයන් ය. එනම් එහි දී අදාල ගායනය හෝ පද කොටස ප්‍රස්තාර කිරීම කරනු ලැබේ.

**ප්‍රස්තාර කිරීමේ දී මාත්‍රා නිරූපණය කරන්නේ සංඛ්‍යා ලෙසය**

## ප්‍රස්තාරකරණයේ දී භාවිතා කරනු ලබන සංකේත

**තිත් තෙයි සංඥා** ^ /

**නිශ්ශබ්දතාවය ( අවග්‍රහ සංඥා )** +

**මාත්‍රා ඇදී පවතින බව** - - -

**මාත්‍රා කැටි වී ඇති බව** ◡

පහත කරුණු පිළිබඳව ද අවධානය යොමු කර ප්‍රස්තාරකරණයේ යෙදිය යුතුය.

වැදගත්

✓ ප්‍රස්තාරකරණයේ දී පැන්සලක් භාවිතා කරන්න.

✓ තමන් හොඳ හැටි දන්නා යමක් වුවත් , එය පදයෙන් පදයට තාල තබමින් ප්‍රස්තාර කරන්න .

✓ පිරිසිදුව ,පැහැදිලිව ප්‍රස්තාරකරණයේ යෙදෙන්න.

✓ දෙවරක් පරීක්ෂා කර බලන්න.

## සුළු තනි තිතට අයත් බෙර පද ප්‍රස්තාර කිරීම ( මාත්‍රා 2 + 2 )

| තාල සංඥා -> | / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|---|
| තාල රූපය -> | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| **උඩරට** | දො | ම් | කි | ත | කි | ත | දොම් ◡ | - |
| **පහතරට** | රු | ද | කි | ට | ග | ත | දොම් ◡ | - |
| **සබරගමු** | ජි | ම් | ත | ග | තා | - | කු | ද |

## මාත්‍රා 2 + 2 තාලයට ( සුළු තනි තිතට ) අදාළ රබන් පද ප්‍රස්තාර කිරීම

| තාල සංඥා -> | / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|---|
| තාල රූපය -> | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| රබන් පදය -> | උඩ | පල | ගත් | තත් | වට් | ටක් | කා | - |
| | බිම | පල | ගත් | තත් | වට් | ටක් | කා | - |
| | උඩ | පල | ගත් | තත් | බිම | පල | ගත් | තත් |
| | පුං | චිපුං | -චි | ගෙඩි | වට් | ටක් | කා | - |

## මාත්‍රා 2 + 2 තාලයට සුළු තනි තිතට අදාළ ලී කෙළි ගායනයක් ප්‍රස්තාර කිරීම

| තාල සංඥා -> | / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|---|
| තාල රූපය -> | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| කවිය-> | එ | ක | ප |ඳු | රෙන් | - | ලී | - |
| | ස | යක් | - | ක | පා | - | ගෙ | න |
| | එ | ක | උ | ස | ඇ | ති | ස | දෙ |
| | නෙක් | - | තෝ | - | රා | - | ගෙ | න |
| | ගු | රුන් | - | අ | ත | ට | දී | - |
| | ලී | - | බෙ | ද | වා | - | ගෙ | න |
| | අ | පිත් | - | කෙ | ලි | මු | ලී | - |
| | දෙ | පි | ල | සෑ | දී | - | ගෙ | න |

## මාත්‍රා **3 + 3** තාලයට **(** මැදුම් තනි තිත **)** අදාළ ලී කෙළි ගායනයක් ප්‍රස්තාර කිරීම

| තාල සංඥා -> | / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල රූපය -> | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කවිය -> | + | ඉර | ට | ඔ | බි | ය | ඉ | ර | මු | දු | නේ | - |
| | + | සි | ටි | යා | - | - | - | - | - | - | - | - |
| | + | සඳ | ට | ඔ | බි | ය | ස | ඳ | ව | ට | ත | රු |
| | + | දි | ලි | යා | - | - | - | - | - | - | - | - |

## මාත්‍රා **4 + 4** තාලයට **(** මහ තනි තිත **)** අදාළ ලී කෙළි ගායනයක් ප්‍රස්තාර කිරීම

| තාල සංඥා -> | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල රූපය -> | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය -> | + | රට | ලින් | - | ඇ | ර | ලා | - | ප | ටි | ගෙන් | - | නා | - | ලා | - |
| | + | දඟ | රෙ | ට | දා | - | ලා | - | ගො | ත | න | ර | ඝෝ | - | - | - |
| | + | ලී | ගෙන් | - | නා | - | ලා | - | දැ | - | ත | ට | දී | - | ලා | - |
| | + | පේ | ලි | ය | සැ | දි | ලා | - | ග | ස | න | ර | ඝෝ | - | - | - |


සැකසුම :

රවිඳු පලිහවඩන

නර්තනය විෂය ආචාර්ය

හලා/වෙන්/ මැල්ලව කණිෂ්ඨ විද්‍යාලය